**ජා-ඇල නගර සභාව - 2022**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

ජා-ඇල නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ජා-ඇල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දේපළ පිරියත හා උපකරණ හීන වන ශේෂ ක්‍රමය අනුව ක්ෂය කරන බවට සඳහන් කර තිබුණු නමුත් රු.172,808,977ක් වූ දේපළ පිරියත හා උපකරණ සඳහා ක්ෂය කර නොතිබුණි. | 2023 අවසාන ගිණුම සකස් කිරීමට පෙර මෙම කාර්යය නිමාකර ගිණුම්කරන ප්‍රමිති 6.10ප්‍රකාරව ක්ෂය කිරීම් ද සිදු කිරීමට පියවර ගන්නා බව. | ප්‍රමිත ප්‍රකාරව වත්කම් ක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ 18.7 ඡේදය අනුව සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද සභාව සතු ඉඩම් කැබලි 235 ක්, යන්ත්‍ර උපකරණ, කරත්ත හා ලී බඩු හා සවිකිරීම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ඉඩම් කැබලි 235 සභාව සතු පාරවල් පළල් කිරීම සඳහා පවරාගත් ඉඩම් ඉතා කුඩා ප්‍රමාණ වන අතර වර්තමානයේ භෞතිකව හඳුනාගැනීම පවා අසීරු කටයුත්තක් වී ඇත. ලී බඩු, උපකරණ හා සවිකිරීම් අයිතම 2023 අවසාන ගිණුම සකස් කිරීමට පෙර ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව. | සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන වියදම් සහ ඊට අදාළ රු.29,467,017 ක් වූ කර්මාන්ත ණයහිමියෝ ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදිව ඉදිරියේ දී සකස් කිරීමට පියවර ගන්නා බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල ගබඩා ණයහිමියන්ට ගෙවා තිබූ රු. 478,253 ක් ගබඩා ණයහිමි ලෙජර් ගිණුමට හර කර නොතිබුණි. | 2023 වසර අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙම ඌණතාවය ජර්නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී පොදු ගබඩාවෙන් රු.2,279,640 ක භාණ්ඩ නිකුත් කිරීම් පොදු ගබඩා පාලන ගිණුමට බැර කරනු වෙනුවට ගබඩා ණයහිමි ගිණුමට බැර කර තිබුණි. | 2023 අවසාන ගිණුම සකස් කිරීමේ දී ජර්නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 හා 2020 වර්ෂයට අදාලව ගෙවිය යුතු වූ රු.827,314 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | 2019 හා 2020වර්ෂය වලට අදාළ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත වී ඇති බව . | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුව රු.5,000,000 ක් වූ විදුලි සෝපානයක් මිලදී ගැනීම සඳහා පුවත්පත් දැන්වීම පළ කිරීම පමණක් සිදුකර තිබියදී එහි වටිනාකම දේපළ පිරියත හා උපකරණ යටතේ වූ ගොඩනැගිලි කෙරීගෙනයන වැඩ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | මහ සභාවේ 05 – 01 යටතේ අනුමැතිය මත ඇගයීම් කමිටුවක් වෙත අදාළ ලිපිගොනු මේ වන විට යොමු කර ඒ අනුව විදුලි සෝපානයක් මිල දී ගැනීම සඳහා මෙම මුදල වෙන්කර ඇත. | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දී සභාවේ අරමුදලින් වැටුප් පිළියෙල කිරීමේ මෘදුකාංගයක් මිලදීගැනීම වෙනුවෙන් වූ රු.865,000 ක් හා ඉකුත් වර්ෂයේ මානව සම්පත් කළමනාකරණ මෘදුකාංගය මිලදී ගැනීමට වැයවූ මුදලින් රු.927,200 ක් ජර්නල් 36 මඟින් ප්‍රාග්ධනිත කර තිබුණද විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ භෞතික සැලසුම් යටතේ වියදමක් ලෙස ද ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | -එම- |
| (උ) | මානව සම්පත් කළමනාකරණ මෘදුකාංගය සඳහා වැය කර තිබුණු මුල් වටිනාකම රු.2,995,000 ක් ප්‍රාග්ධනිත කළ යුතු වුවත් රු.927,200 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | ජා - ඇල නගර සභා ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ මුළු මුදල වූ රු.4,731,766 ක් ප්‍රාග්ධන ප්‍රදාන හා දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතු වූ මුදල වූ රු.2,195,016 පමණක් ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන හා ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කර තිබුණු අතර රු.2,536,750 ක් ආදායමට හා වියදමට ගලපා ගලපා තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී මෙම ඌණතාවයන් ඇති නොවන පරිදි සකස් කිරීමට පියවර ගනු ලබන බව. | -එම- |
| (එ) | වෙළෙඳ ස්ථාන කුලී 1 සඳහා රු.13,220,646 ක් වූ සත්‍ය බිල්කිරීම රු.2,520,600 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම රු.10,700,046 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී මෙම ඌණතාවය නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | -එම- |
| (ඒ) | සභාව විසින් භාවිතා කරන නව වෙළෙඳ සංකීර්ණයේ කඩකාමර 5 ක් සඳහා 2018 වර්ෂයේ සිට සාවද්‍ය ලෙස කඩකුලී බිල් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වර්ෂයේ ආදායම රු.561,117 ක් සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට | 2023 ගිණුම සැකසීමේ දී මෙම වටිනාකම ලේඛනවලින් ඉවත්කර ගිණුම තාත්වික කිරීමට පියවර ගන්නා බව. | -එම- |

| | | |
|---|---|---|
| ලැබිය යුතු කඩ කුලී රු.2,627,234 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශවල දැක්වේ. | | |
| (ඔ) 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.33,296,736 ක් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මුද්දර ගාස්තු ආදායම් ලබා ගැනීමේ දී ඇති වී තිබෙන පොදු ප්‍රමාදය සලකා ලැබීම් පදනම මත ගිණුම් තැබීම සිදුකරනු ලබන බව. | -එම- |
| (ඕ) ගොඩනැගිලි ඉදිකිරීම් හා මාර්ග, බෝක්කු හා පාලම් වෙනුවෙන් වූ සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් රු.4,402,318 ක් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | ඉදිරි ගිණුම් වාර්තා සකස් කිරීමේ දී මෙම අඩුපාඩු නිවැරදිවන සේ ගිණුම් සකස් කිරීමට පියවර ගන්නා බව. | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල එකතුන් හා ලෙජර් ගිණුම් 15 ක ශේෂයන් අතර රු.46,156,897 ක වෙනසක් විය. | 2023 ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන රු.13,061,119 ක් සඳහා ශේෂ සනාථන ලිපි ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | පිළිතුරු ලබා දී නොමැත. | අදාළ උපලේඛනය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය | මූල්‍ය පාලනය පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ඉටුකළයුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | ආයතනයේ ඇති කළ වෙනස්කම් පිළිබඳ ලිඛිත සමාලෝචනයක් විගණකාධිපති වෙත යොමු කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) මුදල් රෙගුලාසි

| | | | | |
|---|---|---|---|---|
| I | මු.රෙ. 110(1) | නගර සභාව විසින් හානි පාඩු ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. | හානි පාඩු ලේඛනයක් සකස්කර යාවත්කාලීනව පවත්වාගෙන යන ලෙස සභාවේ කර්මාන්ත අංශය වෙත උපදෙස් දුන් බව. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| II | මු.රෙ. 571 | රු.5,200,068 වර්ෂ 2 ඉක්මවූ ඉකුත් තැන්පතු නියාදනය කර නොතිබුණි. | 2021 ,2020 වර්ෂවල දී වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර ඇති අතර 2023 වර්ෂයේ දී ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කරන ලෙස ගිණුම් කළමනාකරණ සහකාරට උපදෙස් දුන් බව. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| IV | මු.රෙ. 880 | සභාවෙහි ඇප තැබීම සඳහා අවශ්‍ය නිලධාරීන්ගෙන් තුන්දෙනෙකු පමණක් ඇප තබා තිබුණි. | වර්තමාන රාජකාරී ඉටුකරනු ලබන ඇප තැබිය යුතු සියලු නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබාගැනීමටත් ඊට අදාළ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගැනීමටත් පියවර ගන්නා බව. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. **මූල්‍ය සමාලෝචනය**

### 2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.25,390,607 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.44,943,673 ක් විය.

### 2.2 **මූල්‍ය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2022 සැප්තැම්බර් 01 දින බිල් නොකළ මාර්ගගත ගෙවීම් යටතේ වූ රු.56,372 ක වැඩිපුර තැන්පත් මුදල සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගෙන ගිණුම්වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ආයතනය සමඟ කටයුතු කොට මාර්ගගත ගෙවීම් කඩිනමින් නිරවුල්කොට ගිණුම්ගත කිරීමට පියවර ගන්නා බව. | අදාල වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### **2.3** **ආදායම් පරිපාලනය**

#### **2.3.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | '000 | '000 | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| (i) | වරිපනම් හා බදු | 46,330 | 46,185 | 38,687 | 54,320 | 45,330 | 39,932 | 34,650 | 34,913 |
| (ii) | කුලී | 22,597 | 17,666 | 21,143 | 13,655 | 22,577 | 19,566 | 6,552 | 18,648 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,200 | 443 | 482 | (39) | 1,200 | 528 | 528 | - |
| (iv) | වෙනත් ආදායම් | 93,409 | 18,773 | 18,868 | (96) | 92,735 | 35,375 | 35,375 | - |
| | | 163,536 | 83,067 | 79,180 | 67,840 | 161,842 | 95,401 | 77,105 | 53,561 |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ මුලු ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 59ක් බිල් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මුලු ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 51ක් පමණක් බිල් කර තිබුණි | පිළිතුරු ලබා දී නොමැත. | තාත්විකව ඇස්තමේන්තු සකස්කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය නොකොට රු.865,000 කට වැටුප් හා වාර්තා කළමනාකරණ මෘදුකාංගයක් මිලදී ගෙන තිබුණද ක්‍රියාත්මක තත්වයට පත්කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අදාළ මෘදුකාංගය එම සමාගමෙන් සහා තීරණයන්ට අනුකූලව මිල දී ගැනීමටත් කටයුතු කර ඇති බව. | මිලදී ගැනීම්වලදී ප්‍රසම්පාදන ක්‍රියාවලි අනුගමනය කළ යුතුය. |
| (ඇ) | 2019, 2020 හා 2022 වර්ෂවලදී එකතුව රු.8,435,000 ක් ගෙවා පරිගණක මෘදුකාංග පද්ධති 11 ක් මිලදී ගෙන තිබුණු අතර 2019 වර්ෂයේදී එළඹී ගිවිසුමේ අංක 6.1 – 6.10 දක්වා වූ කොන්දේසිවලට අවධානය යොමු කර දත්තවල සුරක්ෂිතභාවය පිළිබඳව සැලකිලිමත් වී වංචා හා දූෂණ වලක්වාලීම සඳහා එම කොන්දේසි අනුගමනය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | දත්තවල සුරක්ෂිතභාවය පිළිබඳව සැලකිලිමත් වී වංචා හා දූෂණ වලක්වාලීම සඳහා එම කොන්දේසි අනුගමනය කළ යුතුය. |
| (ඉ) | තොග හා ගබඩා කළමනාකරණ මෘදුකාංග පද්ධතිය සඳහා 2020 ජුනි 18 දිනවන විට රු.655,000 ක් ගෙවා තිබුණද විගණිත දිනය වූ 2022 සැප්තැම්බර් 30 දින වන විටත් | -එම- | පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පද්ධතිය ක්‍රියාත්මක තත්වයේ නොතිබීමෙන් මෙම වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | | |
| (ඊ) | සියලු ගිණුම් සහ වාර්තා කළමනාකරණ මෘදුකාංගය සඳහා 2020 ජුනි 18 දින වන විට රු.695,000 ක් ගෙවා තිබුණද විගණිත දිනය වූ 2022 සැප්තැම්බර් 30 දින වන විටත් මෘදුකාංග පද්ධතියේ ඇතුලත් තුලනය කරන ලද මාසික ගෙවීම් වාර්තාව (LG 11) ලබාගැනීම, මුල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා බැංකු සැසඳුම් පිළියෙල කිරීම යනාදි කාර්යයන් ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | -එම- | -එම- |
| (උ) | එක් මෘත දේහයක් දහනය කිරීම සඳහා වැයවන සාමාන්‍ය ගෑස් ප්‍රමාණය පිළිබඳව දහන වාර්තාවක් සභාව ලබාගෙන නොතිබුණු අතර ආදාහනාගාරය වෙත ලැබෙන ගෑස් ප්‍රමාණය, වැය වූ ප්‍රමාණය හා ඉතිරි ප්‍රමාණය දක්වමින් ආදාහනාගාර භාරකරු විසින් විධිමත් ලේඛනයක් පවත්වා නොතිබුණි. | කපුවත්ත ආදාහනාගාරයේ ආදාහන භාරකරු වෙත යොමු කරන මෘත දේහ පිළිබඳ ලේඛනයක් ආදාහන භාරකරු විසින් පවත්වාගෙන යනු ලබන අතර ගබඩාවෙන් නිකුත් කරනු ලබන ගෑස් සිලින්ඩර් ප්‍රමාණයන්ගෙන් ආදාහන සිදු කළ මෘත දේහයන් පිළිබඳ ලේඛනය සමඟ නිකුත් කළ ගෑස් ප්‍රමාණ හා සසඳා වැය වූ ගෑස් ප්‍රමාණය පිළිබඳ විටින් විට ඇගයීම සිදු කරනු ලබන බව. | විධිමත් ලේඛන පවත්වාගෙන යා යුතුය. |
| (ඌ) | 2022 සැප්තැම්බර් 29 දින ආදාහනාගාරය පිළිබඳව සිදුකළ භෞතික පරික්ෂාවේදී ආදාහනාගාරයේ පෝරණුව ඇතුලත බර්නර් අතර ගල් ගැලවී තිබුණු බවත් ඒ හේතුවෙන් බර්නරයෙන් පිටවන දුම් බාහිර පරිසරයට කාන්දුවන බවත් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | නිසි පරිදි අළුත්වැඩියාවන් සිදුකළ යුතුය. |

3.2 **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් කළ වාහන සමීක්ෂණයේදී හඳුනාගෙන තිබූ සභාව සතු අත්කරත්ත 3 ක ඌනතාවය පිළිබඳව විමර්ෂණයක් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වාහන සමීක්ෂණ වාර්තාව හා වාහන උපලේඛනය නිසි පරිදි පිළියෙළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් ඉදිරිපත් කළ සමීක්ෂණ වාර්තාව අනුව සභාව සතු ඉඩම් 4 ක භූමි ප්‍රමාණයන් තහවුරු කර ගැනීමට නොහැකිවී තිබුණි. | -එම- | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වෙන්කර හඳුනාගෙන තක්සේරු වටිනාකම් ද හඳුනා ගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රාථමික මට්ටමේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 11 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 5 ක පුරප්පාඩු 11 ක් ද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක පුරප්පාඩුව ක් ද විය. | ප්‍රාථමික හා ද්විතියික පුරප්පාඩු පිළිබඳව ප්‍රගති වාර්තා මඟින් පළාත් පාලන දෙපාර්තමේන්තුව මෙන්ම ප්‍රධාන ලේකම් දැනුවත් කර ඇත . | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |